**සමූපකාර සංවර්ධන අරමුදල - 2019**

**------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළමතය

**-----------------------------**

සමූපකාර සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළමතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශනපිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1හි 21 ඡේදය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමග ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණු අතර දායක මුදල්, චක්‍රීය අරමුදල හා මහජන බැංකු ආධාර සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ පත්‍ර විග්‍රහයතුළ මේ සම්බන්ධයෙන් සටහන් කර ඇති අතර ප්‍රවර්ථන වසරේ සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ආධාර ගිණුමේ රු.306,498 ක්වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අතිරික්තයට මාරු කර තිබුණි. මෙම ගැලපීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට බලපෑමක් නොවූවද එය මූල්‍ය ක්‍රියාකාරකම යටතේ මුදල් ගලා යාමක් වශයෙන් දක්වා තිබුණි. | ප්‍රවර්ථන වසරේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.5,481,300ක්වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත07 ප්‍රකාරව අදාල වත්කම් හඳුනා ගැනීමෙන් අනතුරුවප්‍රත්‍යාගණනය කර ඉදිරියේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සමූපකාර සමිති වලින් රු.26,854,335 ක දායකය මුදලින් ලැබී තිබුණද, එය ලැබිය යුතු දායක මුදල් ගිණුමට ගිණුම්ගත කිරීමේදී රු.26,654,336 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.200,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සී/ස සමූපකාර අලෙවි සංගමයෙන් දායක මුදල් වශයෙන් ලද අංක 282329 හා රු.200,000ක චෙක්පතක් උපලේඛනයේ සටහන් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂය නිසා මෙම දෝෂය සිදුවී ඇති අතර, ප්‍රවර්ථන වසරේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආදායම රු.101,412,349 ක් විය යුතු වුවද, ආදායම් වියදම් ප්‍රකාශයේ එය රු.101,612,349 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.200,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සී/ස සමූපකාර අලෙවි සංගමයෙන් දායක මුදල් වශයෙන් ලද අංක 282329 හා රු.200,000ක චෙක්පතක් උපලේඛනයේ සටහන් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂය නිසා මෙම දෝෂය සිදුවී ඇති අතර, ප්‍රවර්ථන වසරේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සමූපකාර සමිති ණය | 47,164,884 | ශේෂ සනාථ කිරීම් | වසර ගණනක් පැරණි ණය ශේෂ වන අතර ක්‍රියාකාරී සමිති හඳුනා ගැනීමෙන් අනතුරුව ශේෂ සනාථන කඩනමින් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ණය ලබාදීම ඌව පලාත | 5,439,905 | ශේෂ සනාථ කිරීම් | | |

## 1.6 ලැබියයුතුසහගෙවියයුතුගිණුම්

### 1.6.1 ලැබියයුතුමුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,999,600 ක්වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,184,000 ක් වූ උසාවි වන්දි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1997 දී පොල්ගොල්ල සමූපකාර විදුහලට ලබා දී ඇතිණය හා කාර්යය සාධන අත්තිකාරම් විස්තර සොයා ගැනීමෙන් අනතුරුව නිරවුල් කිරීමට කටයුතු කරමි . ලැබිය යුතු උසාවි වන්දි මුදල වන රු.1,184,000 සියයට50 එම නිලධාරියාගෙන්ද ඉතිරි සියයට50 රජයේ ගිණුමෙන්ද අයකර ගැනීමට තීරණය වී ඇත. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) සමූපකාර සංවර්ධන අරමුදලින් සමූපකාර සමිති 59 ක් වෙත ලබාදුන් ණය මුදලින් 2019 ජනවාරි 01 දිනට අයවිය යුතුව පැවති රු.34,303,931 ක ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි. මෙම ණය ශේෂ වර්ෂ 07 ක සිට වර්ෂ 55 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් පැවතුනි. | මෙම පළාත් වලින් අයවිය යුතු ණය ශේෂ සඳහා පළාත් කොමසාරිස් සමුළුවලදී දිගින් දිගටම පළාත් කොමසාරිස්වරුන් දැනුවත් කර ඇත. තවද මෙම ණය ශේෂ බොහොමයක් අවු.20 පමණ පැරණි ණය ශේෂ වන බැවින් විස්තර සොයා ගැනීමද දුෂ්කරතාවයක් පවතී. කෙසේ වෙතත් මෙම ණය ශේෂ පළාත් මට්ටමින් කඩිනමින් අය කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසිසහකළමනාකරණතීරණආදියටඅනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් මස 07 දින අංක PS/SP/SB /21/2018 සහ 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB /07/15 දරනජනාධිපතිලේක ම් කාර්යාල චක්‍රලේඛ | සමූපකාර ව්‍යාපාරයේ ඉදිරි ගමන්මග සකස් කිරීමට අදාලව වැඩසටහන් දෙකක් හෝටල් 02 ක පැවැත්වීම වෙනුවෙන් එකතුව රු.3,435,114 ක් අරමුදලින් ගෙවා තිබුණි. | මෙම වැඩසටහන් මාලාවේ පළමු වැඩමුළුව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්බන්ධිකරණය ජාතික සමූපකාර මණ්ඩලය වෙත පැවරීම සිදු කළ අතර , ආයතනය තෝරාගැනීම සිදු වූයේ ජාතික සමූපකාර මණ්ඩලය මගිනි . දෙවන වැඩමුළුව පැවැත් වූ ආයතනය තෝරා ගැනීම සිදු වූයේ දෙපාර්තමේන්තුව මගින් වන අතර , Laya Leisure ආයතනය රජයේ ආරක්ෂක අංශ මගින් පවත්වාගෙන යන ආයතනයක් වන බැවින් ,එම ස්ථානය තෝරාගැනීම සිදු විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.92,070,503 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේඅතිරික්තය රු.19,742,511 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂවසමාලෝචිත වර්ෂයේමූල්‍ය ප්‍රතිඵලයෙහි රු.72,327,992 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. දායක මුදල් ආදායම රු.74,599,170 කින් වැඩිවීම ඉහත වර්ධනයකෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම්අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් පත්‍රය මගින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 43 වගන්තිය ප්‍රකාර සෑම ලියාපදිංචි සමූපකාර සමිතියක්ම තම වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 කට වැඩි නොවන හා රු.5 කට අඩු නොවන මුදලක් දායක මුදල් වශයෙන් අරමුදලට ගෙවිය යුතු වේ.එමඅරමුදල් සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, සමූපකාර සමිතිවල කලමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමූපකාර සමිතිවලට උපකාර කිරීම සඳහායෙදවිය හැකි බව දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අරමුදල සඳහා සමූපකාර සමිතිවල දායකත්වය රු.101,412,349 ක්වූ අතර අරමුදලේ මුළු වියදම රු.32,812,987 ක් විය. මෙම වියදමින් සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ සඳහා රු.15,582,638 ක් දරා තිබුණද ඉන් සියයට 82 ක් එනම් රු.12,836,589 ක් වැය කර තිබුණේ සමූපකාර දින උත්සවයේ හා සමූපකාර ව්‍යාපාරයේ ඉදිරි ගමන්මග වැඩසටහනේ සංග්‍රහ වියදම්, ගමන් වියදම්, අතිකාල සහ වෙනත් වියදම් සඳහාය. | ජාත්‍යන්තර සමූපකාර දින උත්සවයසෑම අවුරුද්දකම ජූලි මස 02 වන සෙනසුරාදා සියළුම සමූපකාරිකයන් විසින් සමරනු ලබයි. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සියළු සමූපකාර ආයතනවල කේන්ද්‍රස්ථානයක් වන බැවින් මෙම උත්සවය ජාතික මට්ටමින් සැමරීමේ වැඩි වගකීමක් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. තවද 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනතේ රීති මාලාවේ 43 (i) වගන්තිය අනුව අරමුදලේ ප්‍රධාන අරමුණක් ලෙස සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, දක්වා ඇත. ඒ අනුව විගණනයෙන් පෙන්වා දී ඇති ආකාරයට ඉදිරියේදී වියදම් පාලනයකින් යුතුව කටයුතු කිරීමට පියවර ගනිමි. | සමූපකාර අරමුදලෙහි මුදල් සමූපකාර ක්ෂේත්‍රයේ දියුණුව සඳහා යෙදවිය යුතුය. |
| (ආ) | සමූපකාර සමිතිවල කලමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමූපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණේ | සමූපකාර සමිතිවල කාර්යක්ෂමතා දියුණු කිරීම සම්බන්ධයෙන් අවශ්‍යතා නිසි ආකාරව හඳුනාගනු ලැබූ | සමූපකාර අරමුදලෙහි මුදල් සමූපකාර ක්ෂේත්‍රයේ දියුණුව සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලේ මුළු වියදමින් සියයට 10 ක්වූ රු.3,192,427 ක් පමණි. | සමුපකාර සමිති සඳහා පමණක් සමූපකාර අරමුදලේ දායකත්වය ලබා දී ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.138,529,076 ක්වූ ලැබිය යුතු දායක මුදල් ශේෂයෙන් වසර 05 කට වඩා පැරණි ශේෂ රු.18,405,066 ක්ද, වර්ෂ 01 ත් 05 ත් අතර කාලය තුල ලැබිය යුතු ශේෂය රු.119,924,008 ක්ද විය. ඉන් සමුපකාර සමිති 13 කින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු දායක මුදලක් ලැබී නොතිබුණු අතර එම සමිති වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 28,453,875 ක් අයවීමට පැවතුනි. | එකඟවෙමි. සමාලෝචිත වර්ෂයේදී මුදා හරින ලද විගණන වාර්තා වෙනුවෙන් අයවිය යුතු දායක මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර හිඟ මුදල්ද වාරික වශයෙන් හෝ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | සමූපකාර සමිතිවල විගණනයන් නියමිත දිනට නිම කර දායක මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලැබිය යුතු දායක මුදල් ශේෂයෙන් රු.99,388,429 ක් එනම් සියයට 71 ක ඉහළ ප්‍රතිශතයක් සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියෙන් අයවිය යුතුව පැවති අතර ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයෙන් රු.2,370,319 ක් අයවීමට පැවතුනි.1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 44 (1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් සමුපකාර සමිති විගණනය කළ යුතු අතර සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියේ හා ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමයේ අවසන් වරට විගණනයන් සිදු කර තිබුණේ පිළිවෙලින් 2014 වර්ෂයේදී හා 2011 වර්ෂයේදීය. | සී/ස අධ්‍යාපන සේවක සමුපකාර සමිතියේ හිඟ දායක මුදල් සඳහා රු. 500,000.00 බැගින් ගෙවීම් සිදු කරන අතර වර්තමානයේ නිදහස් කර ඇති විගණන වාර්තා සඳහා දායක මුදල් වෙන්කිරීම එකවර අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. 2020 වර්ෂයේ 2 වන කාර්තුව වනවිට 2015 වර්ෂයේ විගණනය අවසන් කර විගණන වාර්තාව සමිතිය වෙත මුදා හැර ඇත. 3 වන කාර්තුව වන විට 2016 වර්ෂයේ විගණනය අවසන් කර ඇත. මෙම වාර්තාවේ අවසන් කටයුතු සිදු කරමින් පවතින අතර, මේ දක්වා දෙපාර්තමේන්තුව වෙත බාරදී නොමැත. එසේම 2017 වර්ෂයේ විගණනය සිදුකරමින් පවතින අතර, 2018 හා 2019 වර්ෂවලට අදාල ගිණුම් ඉදිරිපත් කර නොමැත. සී/ස පාරිභෝගික සමුපකාර සමිති සංගමයේ 2012 වර්ෂයේ විගණන වාර්තාව සමිතිය වෙත මුදා හැර ඇත. 2013 වර්ෂයට අදාල විගණන වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර, 2014 | සමූපකාර සමිතිවල විගණනයන් නියමිත දිනට නිම කර දායක මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂයේ විගණනය අවසන් වෙමින් පවතී. 2015, 2016, 2017 හා 2018 වර්ෂ සඳහා ගිණුම් ඉදිරිපත් වී ඇතත් එකී ගිණුම් නිවැරදි නොවන බව සනාථ වන අතර, පූර්ව විගණනයන් අවසන් වන තෙක් විගණකවරුන් යෙදවීමට කටයුතු කර නැත. | |
| (ඉ) | යුධ හානිවලට ලක් වූ සමුපකාර සමිති යලි ගොඩනැංවීම සඳහා 2015 වර්ෂයේදී මන්නාරම දිස්ත්‍රික් ලේකම් වෙත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.28,000,000 ක් ලබාදී තිබුණි. එමමුදලින්රු.18,000,000 ක් 2016 හා 2017 වර්ෂවලදී දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණද, එම මුදල් අමාත්‍යාංශයට ප්‍රේෂණය කර තිබුණේ සමාලෝචිත වර්ෂයේදීය. | මේ සම්බන්ධයෙන් 2019.08.28 දින අමාත්‍යාංශයේ පැවති විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද අතර, එහිදී තීරණය වූ පරිදි අරමුදලේ රඳවාගෙන ඇති රු. 18,000,000.00 ක මුදල නැවත අමාත්‍යාංශයට ප්‍රතිපූරණය කිරීමට තීරණය විය. ඒ අනුව කටයුතු කර ඇත. | අමාත්‍යාංශයෙන් ලද මුදල් අදාල කාර්යයට නියමිත කාල සීමාවන් වලදී යෙදවිය යුතුය. |